# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 642/9—1990 දෙසැම්බර් 27 වැනි බ්‍රහස්පතින්ද—1990.12.27

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)

# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

එල්.ඩී.—බී/21/78 11

### 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනත

1989 අංක 03 දරන විශ්ව විද්‍යාල (සංශෝධන) පනතින් අවසන් වරට සංශෝධිත, 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ 18 වන වගන්තිය සමඟ කියවිය යුතු 140 වන වගන්තිය යටතේ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සාදනු ලැබූ නියමාවලිය.

සී. එස්. කරුණාරත්න මිය,<br>ලේකම්,<br>විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව.

1990 දෙසැම්බර් මස 27 දින,<br>කොළඹ දී ය.

### නියමාවලිය

1. මෙම නියමාවලිය 1990 අංක 02 දරන වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතන (සංශෝධන) නියමාවලිය යනුවෙන් හඳුන්වනු ලබන අතර, එය 1990 දෙසැම්බර් මස 28 වන දින සිට ක්‍රියාත්මක වන්නේය.

2. 1985 දෙසැම්බර් මස 10 වන දින අංක 379/9 දරන අති විශෙෂ ගැසට් පත්‍රයෙන් සංශෝධිත, 1980 අප්‍රේල් මස 10 වන දින අංක 83/7 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරනලද 1980 අංක 01 දරන වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි නියමාවලියේ 10 වන ඡේදය පහත දැක්වෙන පරිදි මෙයින් තව දුරටත් සංශෝධනය කරනු ලැබේ :—

(1) එහි (1) වන අනුඡේදය වෙනුවට පහත දැක්වෙන අනුඡේදය ආදේශ කිරීමෙන් :—

"(1) නිල බලයෙන් පත්වන පහත සඳහන් සාමාජිකවරයන්, එනම් :—

(අ) අධ්‍යක්ෂවරයා ;
(ආ) උසස් අධ්‍යාපන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඒ ලේකම්වරයාගේ නාමිකයා ;
(ඇ) සෞඛ්‍ය විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඒ ලේකම්වරයාගේ නාමිකයා ;
(ඈ) ශික්ෂණ රෝහල් විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඒ ලේකම්වරයාගේ නාමිකයා ;
(ඉ) මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඒ ලේකම්වරයාගේ නාමිකයා ;
(ඊ) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපතිවරයා ;
(උ) සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයා ;
(ඌ) ශික්ෂණ රෝහල් අධ්‍යක්ෂවරයා ;
(එ) වෛද්‍ය සේවා විෂයය භාර සෞඛ්‍ය සේවා නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරයා ;
(ඒ) ශ්‍රී ලංකාවේ කොළඹ විශ්ව විද්‍යාලයේ වෛද්‍ය පීඨාධිපති ;
(ඔ) ශ්‍රී ලංකාවේ පේරාදෙනිය විශ්ව විද්‍යාලයේ වෛද්‍ය පීඨාධිපති ;
(ඕ) ශ්‍රී ලංකාවේ යාපනය විශ්ව විද්‍යාලයේ වෛද්‍ය පීඨාධිපති ;
(ක) ශ්‍රී ලංකාවේ රුහුණු විශ්ව විද්‍යාලයේ වෛද්‍ය පීඨාධිපති; සහ
(කා) ශ්‍රී ලංකාවේ පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ දන්ත විද්‍යා පීඨාධිපති.

(2) (2) (ඉ) අනුඡෙදයේ වගන්තිය වෙනුවට පහත සඳහන් අතුරු වගන්තිය ආදේශ කිරීමෙන් :—

" එසේ වුවද, එසේ පත් කරන ලද සාමාජිකයන්ගෙන් යටත් පිරිසෙයින් සාමාජිකයන් පස් දෙනෙකුවත් වෛද්‍ය වෘත්තියේ සාමාජිකයින් විය යුතු අතර ඔවුන්ගෙන් එක් තැනැත්තෙකු මීට පෙරාතුව ම, ආශුතනයෙහි සිටි අධ්‍යක්ෂවරයා විය යුතුය.''

01—157/1

---

එල්ඩී–බී. 21/78 11

**1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනත**

1989 අංක 3 දරන විශ්ව විද්‍යාල (සංශෝධන) පනතින් අවසන් වරට සංශෝධිත, 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ 18 වන වගන්තිය සමඟ කියවිය යුතු 140 වන වගන්තිය යටතේ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සාදනු ලැබූ නියමාවලිය.

සී. එස්. කරුණාරත්න මිය,
ලේකම්,
විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව.

1990 දෙසැම්බර් මස 27 දින,
කොළඹ දී ය.

නියමාවලිය

1. මෙම නියමාවලිය 1990 අංක 03 දරන කෘෂිකර්ම පශ්චාත් උපාධි ආයතන (සංශෝධන) නියමාවලිය යනුවෙන් හඳුන්වනු ලබන අතර එය 1990 දෙසැම්බර් මස 28 දින සිට ක්‍රියාත්මක වන්නේය.

2. 1979 දෙසැම්බර් මස 26 වන දින අංක 68/11 දරන අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද 1979 අංක 09 දරන කෘෂිකර්ම පශ්චාත් උපාධි ආයතන නියමාවලියෙහි 11 වන ඡෙදය, එහි (6) වන අනුඡෙදය වෙනුවට පහත සඳහන් අනුඡෙදය ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

"(06) කළමනාකාර මණ්ඩලයේ සාමාජිකයින්ට මුදල් විෂයය භාර අමාත්‍යවරයා විමසා අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන පාරිශ්‍රමික හෝ දීමනා ගෙවිය යුතුය.''

01–157/2

---

එල්ඩී.—බී 21/78 11

**1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනත**

1989 අංක 03 දරන විශ්ව විද්‍යාල (සංශෝධන) පනතින් අවසන් වරට සංශෝධිත, 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ 18 වන වගන්තිය සමඟ කියවිය යුතු 140 වන වගන්තිය යටතේ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සාදනු ලැබූ නියමාවලිය.

සී. එස්. කරුණාරත්න මිය,
ලේකම්,
විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව.

1990 දෙසැම්බර් මස 27 දින,
කොළඹ දී ය.

නියමාවලිය

1. මෙම නියමාවලියේ 1990 අංක 04 දරන දේශීය වෛද්‍ය විද්‍යා ආයතන (සංශෝධන) නියමාවලිය යනුවෙන් හඳුන්වනු ලබන අතර එය 1990 දෙසැම්බර් මස 28 දින සිට ක්‍රියාත්මක වන්නේය.

2. 1979 දෙසැම්බර් මස 21 වන දින අංක 67/14 දරන අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද 1979 අංක 7 දරන දේශීය වෛද්‍ය විද්‍යා ආයතන නියමාවලියෙහි 11 වන ඡෙදය, එහි (6) වන අනුඡෙදය වෙනුවට පහත සඳහන් අනුඡෙදය ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

"(06) මණ්ඩලයේ සාමාජිකයින්ට මුදල් විෂයය භාර අමාත්‍යවරයා විමසා අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන පාරිශ්‍රමිකය හෝ දීමනා ගෙවිය යුතුය.''

01—157/3

---

එල්ඩී.—බී. 21/78 11

**1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනත**

1989 අංක 03 දරන විශ්ව විද්‍යාල (සංශෝධන) පනතින් අවසන්වරට සංශෝධිත, 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ 18 වන වගන්තිය සමග කියවිය යුතු 140 වන වගන්තිය යටතේ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සාදනු ලැබූ නියමාවලිය.

සී. එස්. කරුණාරත්න මිය,
ලේකම්,
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව.

1990 දෙසැම්බර් මස 27 දින,
කොළඹ දී ය.

නියමාවලිය

1. මෙම නියමාවලිය 1990 අංක 05 දරන පාලි හා බෞද්ධ අධ්‍යායන පශ්චාත් උපාධි ආයතන (සංශෝධන) නියමාවලිය යනුවෙන් හඳුන්වනු ලබන අතර එය 1990 දෙසැම්බර් මස 28 දින සිට ක්‍රියාත්මක වන්නේය.

2. 1979 දෙසැම්බර් මස 24 වන දින අංක 68/3 දරන අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද 1979 අංක 08 දරන පාලි හා බෞද්ධ අධ්‍යාපන පශ්චාත් උපාධි ආයතන නියමාවලිය 11 වන ඡෙදය, එහි (6) වන අනුඡෙදය වෙනුවට පහත සඳහන් අනුඡෙදය ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

"(6) මණ්ඩලයේ සාමාජිකයින්ට මුදල් විෂයය භාර අමාත්‍යවරයා විමසා අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන පාරිශ්‍රමික හෝ දීමනා ගෙවිය යුතුය."

01—157/4

---

එල්ඩී.—බී. 21/78 11

**1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනත**

1989 අංක 03 දරන විශ්ව විද්‍යාල (සංශෝධන) පනතින් අවසන්වරට සංශෝධිත 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ 18 වන වගන්තිය සමඟ කියවිය යුතු 140 වන වගන්තිය යටතේ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සාදනු ලැබූ නියමාවලිය.

සී. එස්. කරුණාරත්න මිය,<br>ලේකම්,<br>විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව.

1990 දෙසැම්බර් මස 27 දින,<br>කොළඹ දී ය.

නියමාවලිය

1. මේ නියමාවලිය 1990 අංක 06 දරන සෞන්දර්ය අධ්‍යායන ආයතන (සංශෝධන) නියමාවලිය යනුවෙන් හඳුන්වනු ලබන අතර එය 1990 දෙසැම්බර් මස 28 වන දින සිට ක්‍රියාත්මක වන්නේය.

2. 1979 දෙසැම්බර් මස 24 වන දින අංක 68/4 දරන අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද 1979 අංක 10 දරන සෞන්දර්ය අධ්‍යයන ආයතන නියමාවලියෙහි 11 වන ඡෙදය එහි (6) වන අනුඡෙදය ඉවත්කර ඒ වෙනුවට පහත සඳහන් අනුඡෙදය ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

"(06) මණ්ඩලයේ සාමාජිකයින්ට මුදල් විෂයය භාර අමාත්‍යවරයා විමසා අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන පාරිශ්‍රමික හෝ දීමනා ගෙවිය යුතුය."

01—157/5

---

එල්ඩී. බී. 21/78 11

**1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනත**

1989 අංක 03 දරන විශ්ව විද්‍යාල (සංශෝධන) පනතින් අවසන් වරට සංශෝධිත 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ 18 වන වගන්තිය සමඟ කියවිය යුතු 140 වන වගන්තිය යටතේ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සාදනු ලැබූ නියමාවලිය.

සී. එස්. කරුණාරත්න මිය,<br>ලේකම්,<br>විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව.

1990 දෙසැම්බර් මස 27 දින,<br>කොළඹ දී ය.

නියමාවලිය

1. මෙම නියමාවලිය 1990 අංක 07 දරන සේවක අධ්‍යාපන ආයතනය (සංශෝධන) නියමාවලිය යනුවෙන් හඳුන්වනු ලබන අතර එය 1990 දෙසැම්බර් මස 28 දින සිට ක්‍රියාත්මක වන්නේය,

2. 1979 දෙසැම්බර් මස 26 වන දින අංක 68/10 දරන සේවක අධ්‍යාපන ආයතන නියමාවලියෙහි 12 වන ඡෙදයේ 5 වන අනුඡෙදය වෙනුවට පහත සඳහන් අනුඡෙදය ආදේශ කිරීමෙන් එම නියමාවලිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

"(05) ශාස්ත්‍රීය කමිටුවේ සාමාජිකයින්ට විෂයය භාර අමාත්‍යවරයා විමසා අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන පාරිශ්‍රමික හෝ දීමනා ගෙවිය යුතුය."

01—157/6

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.